සැ. යු. - 2017.09.29 දින පළ වූ අංක 2,039 දරන *ගැසට්* පත්‍රයේ IV(අ) කොටස පළ නොවීය.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,040 - 2017 ඔක්තෝබර් මස 06 වැනි සිකුරාදා - 2017.10.06**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු- ඇබෑර්තු .... ... ... | 1816 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 1824 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥානත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |


සැ. යු. -(i) ශ්‍රී ලංකාවේ තරීකතුල් අරූසියතිල් කාදිරිය්යාහ් සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2017 සැප්තැම්බර් මස 29 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) හේෂා මිත්‍රත්ව පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2017 සැප්තැම්බර් මස 29 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2017 ඔක්තෝබර් මස 27 වැනි දින පළකරන ගැසට් පත්‍රයේ දැන්වීම් 2017 ඔක්තෝබර් මස 13 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (වැ. බ.)

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## තනතුරු - ඇබෑර්තු

### බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

මීරිගම ප්‍රාදේශීය සභාව

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මීරිගම ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ පදිංචි අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පළියෙල කරන ලද අයදුම්පත්‍ර සම්පූර්ණ කර අධ්‍යාපන සහතික වල, වෘත්තීය සුදුසුකම් සහතිකවල, පදිංචිය සනාථ කිරීමේ සහතිකවල, උප්පැන්න සහතිකවල පිටපත් සමග "ලේකම්, මීරිගම ප්‍රාදේශීය සභාව, මීරිගම" යන ලිපිනයට 2017/10/20 වැනි දිනට පෙර මාවෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ඉල්ලුම්පත් බහාලන කවරයේ වම්පස ඉහල කෙලවරේ "...(අදාල)..." තනතුර සඳහා ඉල්ලුම්පත යනුවෙන් සඳහන් කර එවිය යුතුය. අසම්පූර්ණ මෙන්ම නියමිත දිනයට පසුව ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

දැනටමත් රජයේ / පළාත් පාලන ආයතනවල සේවයේ නියුතු අයදුම්කරුවන් දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

| *අනු අංකය* | *තනතුර* | *සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | රියදුරු (ප්‍රාථමික ශිල්පීය 111 ශ්‍රේණිය) | 02 | PL 3-2016<br>රු. 25,790-10x270-10x300-10x330-12x350- රු.38,990<br>04 වන පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | සටහන අංක 01 බලන්න. |
| 02 | ඖෂධ සංයෝජක (ප්‍රාථමික අර්ධ ශිල්පීය 111 ශ්‍රේණිය) | 01 | PL 2-2016<br>රු. 25,250-10x270-10x300-10x330-12x350-රු. 38,450<br>04 වන පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා/පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් 06 ක් සමත් වී තිබීම. (මින් විෂයන් 5 ක් එකවර සමත් ව තිබිය යුතුය.) රජයේ ආයුර්වේද බෙහෙත් ශාලාවක හෝ රජය පිළිගත් ලියාපදිංචි ආයුර්වේද බෙහෙත් ශාලාවක ක්ෂේත්‍රයට අදළ වසරක සේවා පළපුරුද්දක් තිබීම. |
| 03 | පුස්තකාල සහායක (ප්‍රාථමික ශිල්පීය නොවන 11 ශ්‍රේණිය) | 03 | PL 1-2016<br>රු. 24,250-10x250-10x270-10x300-12x330- රු. 38,410<br>(12 පියවරේ සිට) 04 වන පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා/පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් 06 ක් සමත් වී තිබීම. (මින් විෂයන් 5 ක් එකවර සමත් ව තිබිය යුතුය.) |
| 04 | මාර්ග කම්කරු (111 ශ්‍රේණිය) | 09 | PL 1-2016<br>රු. 24,250-10x250-10x270-10x300-12x330- රු. 38,410<br>04 වන පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | අවම වශයෙන් 8 ශ්‍රේණිය (9 වසර) සමත්ව තිබීම. |
| 05 | සෞඛ්‍ය කම්කරු (111 ශ්‍රේණිය) | 08 | PL 1-2016<br>රු. 24250-10x250-10x270-10x300-12x330- රු.38,410<br>04 වන පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | අවම වශයෙන් 8 ශ්‍රේණිය (9 වසර) සමත්ව තිබීම. |

සටහන අංක 01

01. *රියදුරු තනතුර සඳහා සම්පූර්ණ කර තිබිය යුතු අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :*

I. අ.පො.ස. සා/පෙළ විභාගයෙන් වාර දෙකකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සිංහල/දෙමළ භාෂාව ඇතුලුව සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව විෂයන් හයක් (06) සමත් වී තිබීම. (එක් වරකදී විෂයයන් පහක් (05) අවම වශයෙන් සමත්ව තිබිය යුතුය.)

II. පෞද්ගලික/කුලී රථ සහ තාර බර හොන්ඩර් 24 ට අඩු ස්ටේෂන්/වැගන් රථ පැදවීම පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකය ලබා තිබිය යුතුය. (බඳවාගන්නා දිනට වසර 03කට පෙර අවම වශයෙන් සී සහ සී1 වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව බී පන්තියේ බලපත්‍රයක් ලබාතිබීම.)

III. මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය.

IV. බලපත්‍රය ලැබීමෙන් පසු වාහන රියදුරෙකු වශයෙන් වසර 03 ක පළපුරුද්දක් තිබිය යුතුය. (සහතිකවලින් සනාථ කළ යුතුය)

V. අවම උස අඩි 5 ක් විය යුතුය.

VI. දිවා කාලයේ දී හා රාත්‍රී කාලයේදී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර මනා ඇස් පෙනීමක් තිබිය යුතුය.

පවත්වනු ලබන වෘත්තීය පරීක්ෂණය හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය මගින් බඳවාගැනීම සිදු කෙරේ.

02. *පොදු කොන්දේසි :*

*අ.* මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

*ආ.* වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

*ඇ.* තෝරාගනු ලබන්නන් අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ. එම කාලය තුළදී පැමිණීම, වැඩ හා හැසිරීම සතුටුදායක නම් පරිවාස කාලය අවසානයේදී සේවය ස්ථිර කරනු ලැබේ. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත තනතුරු ස්ථිර කළ තැනැත්තන් වසර 01 ක වැඩ බැලීමේ කාලයකට යටත් කර බඳවා ගැනු ලැබේ.

*ඈ.* අයදුම්පත් කැඳවන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතුය. (උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණන්න) (දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)

*ඉ.* අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලාංකික විය යුතුය.

*ඊ.* විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යකින් යුක්ත විය යුතුය. තෝරා ගනු ලැබුවහොත් මාසයක් ඇතුළත රජයේ වෛද්‍යවරයෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, එම පරීක්ෂණයේදී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

*එ.* දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.

*ඒ.* අයදුම්පත් භාරගන්නා දිනය වන විට පූර්වාසන්න වසර 03ක කාලයක් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. (ප්‍රාදේශීය ලේකම් සහතික කරන ලද ග්‍රාම නිලධාරි සහතිකය අමුණන්න)

*ඔ.* රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතු අතර, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතුය.

*ඕ.* රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට එකඟ විය යුතුය.

03. *බඳවා ගැනීමේ ක්‍රමය :*

*අ.* මෙම තනතුරු සඳහා ලැබෙන අයදුම්පත් පරීක්ෂා කර බලා සුදුසුකම් ලබන අයදුම්කරුවන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 24/95 ට අනුකූලව සම්මුඛ පරීක්ෂණයකට කැඳවීමෙන් තෝරාගනු ලැබේ.

*ආ.* සම්මුඛ පරීක්ෂණවලින් ලබාගන්නා ලකුණු මත පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ.

*ඇ.* මෙම අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ ඒ අතරතුර හෝ මෙම බස්නාහිර පළාතේ මෙම තනතුරුවලට අදාළ නව බඳවා ගැනීමේ පරිපාටි ව්‍යවස්ථා සංශෝධනය වීම සහ ව්‍යවස්ථා ආදේශ කිරීම ද, බඳවාගැනීම් ප්‍රමාද කිරීම, වෙනස් කිරීම සහ මෙම නිවේදනය අවලංගු කිරීම ද ආදි සියලු බලතල මීරිගම ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු වන්නේය.

ලේකම්,
මීරිගම ප්‍රාදේශීය සභාව.

2017 සැප්තැම්බර් මස 19 වැනි දින,
මීරිගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මීරිගම ප්‍රාදේශීය සභාවේ**
**.................................... තනතුරට බඳවාගැනීම සඳහා අයදුම්පත්‍රය**

01. මුලකුරු සමග නම :————————————.

02. මුලකුරු වලින් හැඳින්වෙන නම :————————————.

03. උපන් දිනය :——————   2017/10/01 දිනට වයස - අවු :——————

04. ස්ථිර පදිංචි ලිපිනය :————————————.

05. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————————————..

06. ජාතික හැඳුනුම්පත් අංකය :——————   දුරකථන අංකය :——————

07. ස්ත්‍රී/පුරුෂ භාවය :————————————.

08. වෙනත් සුදුසුකම් (ඡායා පිටපත් අමුණන්න) :
    I අධ්‍යාපන සුදුසුකම් :————————————.
    II වෘත්තීය සුදුසුකම් :————————————.
    III පළපුරුද්ද :————————————.

09. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ / වෙනත් ආයතනයක සේවය කරන්නේ නම් :
    I දැනට දරන තනතුර :————————————.
    II එම තනතුරට පත් වූ දිනය :————————————.
    III එම පත්වීමේ ස්වභාවය :————————————.
    (ස්ථිර / අනියම් / ආදේශක / කොන්ත්‍රාත්)

10. ඔබ කවරදක හෝ උසාවියකින් වරදකරුවෙකු වී තිබේද යන වග :————————————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හැටියට නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. යම් තොරතුරක් සාවද්‍ය බව බඳවාගැනීමට පෙර හෙළිදරව් වුවහොත් මා නුසුදුස්සෙකු කිරීමට, බඳවාගැනීමෙන් පසු හෙළිදරව් වුවහොත් මා සේවයෙන් පහකිරීමටත් යටත් වන බව හොඳාකාරවම දනිමි.

————————.
අයදුම්කරුගේ අත්සන.

දිනය:——————.

10-58

---

**දකුණු පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම**

කරන්දෙණිය ප්‍රාදේශීය සභාව

කරන්දෙණිය ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුර සඳහා බඳවා ගැනීමට නියමිත සුදුසුකම් සපුරා ඇති දකුණු පළාත් සභා සීමාව තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *මාසික වැටුප් පරිමාණය* | *බඳවා ගැනීමේ අවම අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|
| වැඩ/ක්ෂේත්‍ර කම්කරු III ශ්‍රේණිය | 02 | PL 1-2016 Grade III රු. 24250-10x250-10x270-10x300-12x330- රු.36,410 | 08 වන ශ්‍රේණිය (09 වසර) සමත්ව තිබීම. |

02. *වයස් සීමාව* :

i. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු 45ට නොවැඩි විය යුතුය.

03. *පොදු සුදුසුකම්* :

i. අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලාංකික පුරවැසියෙක් විය යුතුය.

ii. අයදුම්කරුවන් දකුණු පළාත් සභා සීමාව තුළ අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර තුනක කාලයක් ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. කරන්දෙණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචිකරුවන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

iii. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය. තෝරාගනු ලැබුවහොත් මාසයක් ඇතුළත රජයේ වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, එම පරීක්ෂාවේදී ශාරීරික වශයෙන් නුසුදුස්සෙකු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

iv. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු හෝ රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතුය.

v. අයදුම්කරුවන් අදළ තනතුර සඳහා සඳහන් වී ඇති අවම සුදුසුකම් සපුරා තිබිය යුතුය.

04. *පොදු කොන්දේසි* :

i. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාලසීමාවේදී හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම, සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීමේ බලය කරන්දෙණිය ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

ii. දැනට කරන්දෙණිය ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුක්ත ස්ථිර, ආදේශක සේවකයින්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

05. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි* :

i. මෙම තනතුර ස්ථිරය
ii. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට යටත් විය යුතුය.
iii. පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ. එම කාලය තුළ දී වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක වේ නම් පරිවාස කාලය අවසානයේ දී සේවය ස්ථිර කරනු ලැබේ. දැනටමත් රාජ්‍ය සේවයේ, පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත තනතුරේ ස්ථිර කර තැනැත්තන් එක් වසරක වැඩ බැලීමේ කාලයකට යටත් කර බඳවා ගනු ලැබේ.

06. මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසිවලටද, දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝග වලටද, දකුණු පළාත් සභාවේ හෝ දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලටද අනුකූලව සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

07. *බඳවා ගැනීමේ ක්‍රමය* :

i. සුදුසුකම් සපුරන අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරාගනු ලැබේ.

08. *අයදුම්පත් එවිය යුතු ආකාරය :*

අයදුම්පත්‍රය සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කරන ලද පිටපත් ද අමුණා එවිය යුතුය.

i. උප්පැන්න සහතිකය
ii. අධ්‍යාපන සහතික හා පාසැල් හැරයාමේ සහතිකය
iii. පදිංචිය සනාථ කිරීමේ සහතිකය (පදිංචි කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී විසින් මාස 06ක් තුළ දී නිකුත් කරනලදුව අදළ ප්‍රාදේශීය ලේකම් ගේ අනු අත්සන සහිතව තිබිය යුතුය.)
iv. මෑතකදී ලබාගත් චරිත සහතික 2ක්
v. වෘත්තීය හෝ පළපුරුද්ද පිළිබඳ සහතික (තිබේ නම්)
vi. සේවා පළපුරුද්ද පිළිබඳ සහතික

මෙම නිවේදනයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් 2017.10.09 දිනට පෙර "ලේකම්, කරන්දෙණිය ප්‍රාදේශීය සභාව, කරන්දෙණිය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. (අයදුම්පත A 4 ප්‍රමාණයේ කඩදාසිවල සකස් කළ යුතුය.) අසම්පූර්ණ, අපැහැදිලි මෙන්ම නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ද කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

පී. එච්. ටී. කේ. හේමචන්ද්‍ර,
ලේකම්,
කරන්දෙණිය ප්‍රාදේශීය සභාව.

2017 සැප්තැම්බර් මස 06 වැනි දින,
කරන්දෙණිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම් පත්‍රය**

***කරන්දෙණිය ප්‍රාදේශීය සභාව***

*වැඩ/ක්ෂේත්‍ර කම්කරු තනතුර සඳහා අයදුම්පත්‍රය*

1. නම :——————————.
   මුලකුරු වලින් හැඳින්වෙන නම් :——————————.
2. ස්ථිර ලිපිනය :——————————.
3. දිස්ත්‍රික්කය :——————————.
4. උපන් දිනය :——————————.
   අවුරුද්ද :—————— මාසය :—————— දිනය :——————
5. ජාතික හැඳුනුම්පත් අංකය:——————————.
6. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————.
7. අයදුම්පත් භාරගන්නා 2017.10.09 දිනට වයස :
   අවුරුදු :—————— මාස :—————— දින :——————
8. විවාහක/අවිවාහක බව :——————————.
9. ජාතිය :——————————.
10. ඔබ ශ්‍රී ලාංකිකයෙක් ද? ලියාපදිංචියෙන් ද යන වග :——————————.
11. අධ්‍යාපන සුදුසුකම් (සමත් වූ විභාග පිළිබඳ විස්තර) :——————————.
    (i) සමත් වූ වසර/ශ්‍රේණිය :——————————.
    (ii) අ.පො.ස. (සා/පෙළ) විභාගය :——————————.
    විභාග අංක:——————————.
    විභාග වර්ෂය හා මාසය :——————————.
    සමත් වූ විෂයයන්

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

12. වෘත්තීය සුදුසුකම් (සහතික මගින් සනාථ කළ යුතුයි)
13. සේවා පළපුරුද්ද :—————————————.
14. ඔබ කවරදක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද? :—————————————.
එසේ නම් තොරතුරු :—————————————.

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව මෙයින් ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳව කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇති බවට සනාථ වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවද මම දනිමි.

—————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————————.

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු ඉල්ලුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන .........................................................මහතා/මහත්මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ /ආයතනයේ................................................. වශයෙන් සේවය කරයි. ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක./නොහැක. ඔහු/ඇය මොනම ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

—————————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

නම :—————————.
පදවි නාමය :—————————.
දෙපාර්තමේන්තුව/ආයතනය :—————————.
(නිල මුද්‍රාව යොදන්න)

දිනය :—————————.

10-78

---

**මොරටුව මහා නගර සභාව**

මොරටුව මහා නගර සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට සුදුසුකම් සපුරා ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *වැටුප් කේත අංකය* | *වැටුප් පරිමාණය* | *සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | මෝටර් යාන්ත්‍රික ගිනිභට | RS1 - 2016 | රු. 29,540-7x300-27x 370 - රු.41,630 | (i) රාජ්‍ය සේවයේ, පළාත් රාජ්‍ය සේවයේ, රාජ්‍ය සංස්ථා සේවයේ ස්ථිර කරනු ලැබූ ගිනිභටයකු ලෙස අවම වශයෙන් වසර 04ක සෙවා කාලයක් තිබිය යුතුය.<br>(ii) බර වාහන පැදවීමේ බලපත්‍රයක් තිබිය යුතුය.<br>(iii) බර වාහන පැදවීම පිළිබඳ අවම වශයෙන් අවුරුදු 02ක පළපුරුද්දක් තිබිය යුතුය.<br>(iv) බස්නාහිර පළාතේ අදාළ පළාත් පාලන අයතනයේ හෝ එම පළාත් පාලන ආයතනය විසින් බලය පවරනු ලැබූ ආයතනයක් මගින් පවත්වනු ලබන තනතුරට අදාළ වෘත්තීය පාඨමාලාවක් හදාරා සමත් වී තිබිය යුතුය.<br><br>*බඳවා ගැනීමේ ලිඛිත පරීක්ෂණය* :<br>පැය 01ක ප්‍රශ්න පත්‍රයකට පෙනී සිටිය යුතුය.<br>(i) විද්‍යාව (ii) තාක්ෂණය |

| *අනු අංකය* | *තනතුරු නාමය* | *වැටුප් කේත අංකය* | *වැටුප් පරිමාණය* | *සුදුසුකම්* |
|---|---|---|---|---|
| 02 | පළමුවන පන්තියේ ගිනිහට | RS2 - 2016 | රු. 32,010-9x370-17x 195 - රු.43,755 | (i). රාජ්‍ය සේවයේ, පළාත් රාජ්‍ය සේවයේ, රාජ්‍ය සංස්ථා සේවයේ ස්ථිර කරනු ලැබූ ගිනිහටයකු ලෙස අවම වශයෙන් වසර 03ක සේවා කාලයක් තිබිය යුතුය. *හා* (ii) බස්නාහිර පළාතේ අදාළ පළාත් පාලන අයතනයේ හෝ එම පළාත් පාලන ආයතනය විසින් බලය පවරනු ලැබූ ආයතනයක් මගින් පවත්වනු ලබන තනතුරට අදළ වෘත්තීය පාඨමාලාවක් හදරා සමත් වී තිබිය යුතුය. *බඳවා ගැනීමේ ලිඛිත පරීක්ෂණය :* පැය 01ක ප්‍රශ්න පත්‍රයකට පෙනී සිටිය යුතුය. (i) විද්‍යාව (ii) තාක්ෂණය (iii) අන්ත්‍රාදායක ද්‍රව්‍ය |
| 03 | මූලික ගිනිහට | RS3 - 2016 | රු. 32,790-7x370-2x 495 - 25x660 - රු.52,870 | *සුදුසුකම් :* (i) රාජ්‍ය සේවයේ, පළාත් රාජ්‍ය සේවයේ, රාජ්‍ය සංස්ථා සේවයේ ස්ථිර කරනු ලැබූ පළමුවන පන්තියේ ගිනිහටයකු ලෙස අවම වශයෙන් වසර 03ක සේවා කාලයක් තිබිය යුතුය. *හා* (ii) බස්නාහිර පළාතේ අදාළ පළාත් පාලන අයතනයේ හෝ එම පළාත් පාලන ආයතනය විසින් බලය පවරනු ලැබූ ආයතනයක් මගින් පවත්වනු ලබන තනතුරට අදළ වෘත්තීය පාඨමාලාවක් හදරා සමත් වී තිබිය යුතුය. *බඳවා ගැනීමේ ලිඛිත පරීක්ෂණය :* පැය 01 1/2 ක ප්‍රශ්න පත්‍රයකට පෙනී සිටිය යුතුය. (i) විද්‍යාව (ii) තාක්ෂණය (iii) අන්ත්‍රාදායක ද්‍රව්‍ය (iv) විධානය හා නායකත්වය |

*බඳවා ගැනීමේ කොන්දේසි :*

(1) අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් විය යුතුය;

(2) අයදුම්පත් භාර ගන්නා දිනට වයස අවු. 22ට නොඅඩු හා අවු. 45ට නොවැඩි විය යුතුය. (රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු ස්ථිර සේවකයින්ට වයස් සීමාව බලනොපානු ඇත.) ;

(3) අයදුම්කරු මනා සෞඛ්‍ය තත්වයකින් හා යහපත් චරිතයකින් යුක්ත විය යුතුය;

(4) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු හෝ දඬුවම් ලැබූවකු නොවිය යුතුය;

(5) අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේදී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම මොරටුව මහ නගර සභාවේ නාගරික කොමසාරිස් සතුය;

(6) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ *ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සපුරා තිබිය යුතුය;

(7) අදළ බඳවා ගැනීමෙ පරිපාටිවල විධිවිධාන අනුව ලිඛිත වෘත්තීය පරීක්ෂණයක් පවත්වා එහි කුසලතාවය මත තෝරා ගන්නා අයවලුන් සම්මුඛ පරීක්ෂණයට භාජනය කිරීමෙන් අනතුරුව පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගැනීම සිදු කෙරේ;

(8) කිසියම් අයදුම්කරුවකු සම්මුඛ පරීක්ෂණයකට කැඳවූ පමණින් හෝ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටි පමණින් එම අයදුම්කරුවන් බඳවා ගැනීම සඳහා සුදුසුසෙකු ලෙස සලකනු නොලැබේ.

*සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

(1) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. බඳවා ගනු ලබන සේවකයින් වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය;

(2) බඳවා ගනු ලබන අයදුම්කරුවන් වසර 01ක වැඩ පරීක්ෂණ කාලයකට යටත් කරනු ලැබේ;

(3) බඳවා ගැනීමෙන් අනතුරුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග, රජය හා බස්නාහිර පළාත් සභාව වරින් වර නිකුත් කරනු ලබන වෙනත් නියෝග හා මොරටුව මහා නගර සභාවේ නාගරික කොමසාරිස් කලින් කල පනවනු ලබන නියමයන්ට හා රෙගුලාසිවලට යටත්ව සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

*අයදුම්පත් එවිය යුතු ආකාරය :*

(1) අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය ඒ 4 ප්‍රමාණයේ කඩදාසියක දෙපසම ප්‍රයෝජනයට ගනිමින් පිළියෙළ කළ යුතු අතර, අයදුම්පත් 2017.10.31 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ **නාගරික කොමසාරිස්, මහ නගර සභාව, මොරටුව යන ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් හෝ අතේ ගෙනවිත් භාරදිය යුතුය.** ඉල්ලුම් කරන තනතුර අයදුම්පතේ සහ කවරයේ වම්පස ඉහල කෙළවරේ සඳහන් කල යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

(2) මෙම දැන්වීමේ සඳහන් ආකාරයට පටහැනි අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත්‍ර ලෙස සලකා ප්‍රතික්ෂේප කෙරේ.

(3) අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය. එසේ එවනු නොලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

- පොලිස් සහතිකය;
- උප්පැන්න සහතිකය;
- ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිතව ග්‍රාම නිලධාරී විසින් නිකුත් කළ පදිංචිය පිළිබඳ සහතිකය;
- මෑතකදී ලබාගත් චරිත සහතිකයක්;
- වෘත්තීය සුදුසුකම් සනාථ කිරීම සඳහා සහතික.

(4) යම් අයදුම්කරුවකු තනතුරු එකකට වඩා වැඩි ගණනක් සඳහා අයදුම්පත් ඉදිරිපත් කරන්නේ නම් එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත්‍ර පිළියෙල කර වෙන වෙනම කවරවල බහා ඉදිරිපත් කළ යුතුය.

එම්. එම්. සී. කේ. කේ. මාන්නප්පෙරුම,<br>
නාගරික කොමසාරිස්,<br>
මොරටුව මහ නගර සභාව.

2017 සැප්තැම්බර් මස 21 වන දින,<br>
මොරටුව මහ නගර සභාවේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මොරටුව මහ නගර සභාවේ ........................................................... තනතුර සඳහා අයදුම්පත්‍රය**

1. මුලකුරු සමග නම :——————————.
2. මුලකුරු වලින් හැඳින්වෙන නම :——————————.
3. ස්ථිර ලිපිනය:——————————.
4. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————————.
5. ජාතික හැඳුනුම්පත් අංකය :——————————. දුරකතන අංකය :——————————.
6. උපන් දිනය අවුරුද්ද :————— මාසය :————— දිනය :—————
7. ජාතිය :——————————.
8. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු :————— මාස :————— දින :—————
9. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————.
10. විවාහක/අවිවාහක බව :——————————.
11. ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? එසේනම් පරම්පරාවෙන් ද? ලියාපදිංචියෙන් ද? :——————————.

12. අධ්‍යාපන සුදුසුකම් :——————————.
13. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :——————————
14. වෙනත් සුදුසුකම් :——————————
15. ඔබ දැනටමත් මෙම නගර සභාවේ සේවයේ නියුක්තව සිටින්නේ නම්, ඒ පිළිබඳ විස්තර ඃ
    I දැනට දරන තනතුර :——————————
    II අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත් ද යන වග ? :——————————
    III එම තනතුරට පත් වූ දිනය :——————————
16. ඔබ කවරදක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවකු කරනු ලැබ තිබේ ද? :——————————

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට පෙර නුසුදුස්සකු වන බව හා පත්වීම් ලැබීමෙන් පසුව ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් රහිතව සේවයෙන් පහ කිරීමට යටත් වන බව ද දනිමි.

——————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————.

*දැනට රාජ්‍ය සේවයේ නියුක්තව සිටින අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු/කාරිය වන ..........................................................මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ ............................................වශයෙන් සේවයේ නියුක්තව සිටී. මෙම තනතුර සඳහා තෝරා ගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත්, ඔහු/ඇය කුමන ආකාරයක හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

.................................
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :——————————
තනතුර :——————————
නිල මුද්‍රාව :——————————

10-168

# පළාත් පාලන නිවේදන

## මැදදුම්බර ප්‍රදේශීය සභාව

ගෝඝාතක ආඥාපනත (272 වැනි අධිකාරය)

මෙහි පහත උපලේඛනයේ සඳහන් අය විසින් එම උපලේඛනයේ සඳහන් ස්ථානයේ දී මස් පිණිස එළ හරක් ඝාතනය කිරීමේ ගෝඝාතකාගාරයක් පවත්වාගෙන යාම පිණිස 2018.01.01 දින සිට 2018.12.31 දින දක්වා කාලයට බලපත්‍ර ඉල්ලුම් කර ඇති බවත්, ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳව මැදදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි යම් අයකු විරුද්ධ වන්නේ නම්, ඔහු හෝ ඇය විරුද්ධ වන්නේ කුමන කරුණක් නිසා ද යන වග පිටපත් දෙකකින් යුක්තව ලියවිල්ලක් මගින් මෙම දැන්වීම *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ඉදිරිපත් කළ යුතු බව ගෝඝාතක ආඥාපනත (272 වැනි අධිකාරය) 7(1) වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) උපවගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙයින් දැනුම් දෙමි.

සුමනා විජේරත්න,
ලේකම්,
මැදදුම්බර ප්‍රාදේශීය සභාව.

2017 සැප්තැම්බර් මස 13 වැනි දින,
මැදදුම්බර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *ඉල්ලුම්කරුගේ නම* | *ගෝඝාතකාගාරය පිහිටි ස්ථානය* | *ස්වභාවය* |
|---|---|---|
| H. M. ෆාරුක් මයා | අංක 244, අඹගහලන්ද, තෙල්දෙණිය | මස් පිණිස එළ හරක් ඝාතනය කිරීම |

10 - 11/1

---

**මැදදුම්බර ප්‍රාදේශීය සභාව**

ගෝඝාතක ආඥාපනත (272 වැනි අධිකාරය)

මෙහි පහත උපලේඛනයේ සඳහන් අය විසින් එම උපලේඛනයේ සඳහන් ස්ථානයේ දී එළ ගවමස් වෙළඳාම සඳහා කඩයක් පවත්වාගෙන යාම පිණිස 2018.01.01 දින සිට 2018.12.31 දින දක්වා කාලයට බලපත්‍ර ඉල්ලුම් කර ඇති බවත්, ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳව මැදදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි යම් අයකු විරුද්ධ වන්නේ නම්, ඔහු හෝ ඇය විරුද්ධ වන්නේ කුමන කරුණක් නිසා ද යන වග පිටපත් දෙකකින් යුක්තව ලියවිල්ලක් මගින් මෙම දැන්වීම *ගැසට් පත්‍රයේ* පල වූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ඉදිරිපත් කළ යුතු බව ගෝඝාතක ආඥා පනත (272 වැනි අධිකාරය) 7(1) වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) උපවගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙයින් දැනුම් දෙමි.

සුමනා විජේරත්න,
ලේකම්,
මැදදුම්බර ප්‍රාදේශීය සභාව.

2017 සැප්තැම්බර් මස 13 වැනි දින,
මැදදුම්බර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *ඉල්ලුම්කරුගේ නම* | *ගවමස් වෙළෙඳසැල පිහිටි ස්ථානය* | *ස්වභාවය* |
|---|---|---|
| H. M. ෆාරුක් මයා | අංක 70A, අඹගහලන්ද, තෙල්දෙණිය | එළ ගවමස් වෙළෙඳාම |

10 - 11/2

---

**කොළොන්නාව නගර සභාව**

2018 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 184 (අ) වන වගන්තියෙන් කොළොන්නාව නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, කොළොන්නාව නගර සභාවේ 2017 වර්ෂයේ සැප්තැම්බර් මස 07 වැනි දින පවත්වන ලද තීරක කමිටු රැස්වීමේ දී පහත සඳහන් තීරණය ගන්නා ලද බව මෙයින් නිවේදනය කරමි.

ලේකම් හා බලතල, කාර්ය, කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
කොළොන්නාව නගර සභාව.

2017 සැප්තැම්බර් මස 07 වැනි දින,
කොළොන්නාව නගර සභාවේ දී ය.

**තීරණය**

කොළොන්නාව නගර සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්ය කර්තව්‍ය ඉටු කරන කොළොන්නාව නගර සභාවේ ලේකම් ඒ. එම්. පියදාස වන මම 255 අධිකාරය වන නගර සභා ආඥා පනතේ 184 (අ) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව කොළොන්නාව නගර සභා බල ප්‍රදේශය සඳහා 2018 වර්ෂයට අදාළව වරිපනම් බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මම තීරණය කරමි. එනම්;

255 අධිකාරය වන නගර සභා ආඥා පනතේ 184 වන වගන්තියේ (අ) වන උප වගන්තිය යටතේ කොළොන්නාව නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව බල ප්‍රාදේශය තුළ දියුණු කළ ප්‍රදේශ යැයි ප්‍රකාශයට පත්කර ඇත්තා වූ ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ නිවාස වල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා 2018 වර්ෂය සඳහා වූ තක්සේරුව/ සතොක්ෂණය වර්ෂය සඳහා තක්සේරුව/ සතොක්ෂණය ලෙස සම්මත කළ යුතු බවටත් එකී තක්සේරුව මත 255 වන අධිකාරය වන නගර සභා ආඥා පනතේ 184 (අ) උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සභා බල ප්‍රදේශ තුළ පිහිටි සියලුම ව්‍යාපාරික හා වාණිජමය ස්ථානවල දැනට තක්සේරු කර ඇති වාර්ෂික වටිනාකමින් 20%ක ප්‍රතිශතයක් හා අනෙකුත් සියලුම නිවාස හා තනාගෙන යන ගොඩනැගිලි, ඉඩම් හා කුඩා නිවාස පන්තිවලට වාර්ෂික වටිනාකමින් 8% ක ප්‍රතිශතයක් ද වරිපනම් බදු ලෙස පනවා අය කිරීමටත්,

තවද, 2018 වර්ෂයේ පළමුවැනි, දෙවැනි, තෙවැනි සහ සිවුවැනි කාර්තුවල වරිපනම් බදු පිළිවෙලින් මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනයන්හි හෝ ඊට පෙර අදාළ වන පරිදි ගෙවා අවසන් කළ යුතු බවත්, එසේ නොගෙවනු ලබන වරිපනම් බදු වෙනුවෙන් දේපළ ස්වභාවය අනුව පිළිවෙලින් 20% (විස්සක) හා 15% (පහළවක) අධි ගාස්තුවක් අය කිරීමටත්,

තවද, 2018 ජනවාරි මස 31 වන දින ප.ව. 3.00ට හෝ ඊට පෙර මුලු වර්ෂයටම වරිපනම් ගෙවනු ලැබුවහොත් එසේ ගෙවනු ලබන මුදලින් 10% (දහයක) වට්ටමක්ද, එම මුදල් කාර්තුව වශයෙන් ගෙවන විට කාර්තුවේ පළමු මස තුළ ගෙවනු ලැබුවහොත් ගෙවනු ලබන මුදලින් 5% (පහක) වට්ටමක් ද ලබා දීමටත් තීරණය කරමි.

යූ. ඒ. ජී. ගයත්‍රි උඩගෙ ආරච්චි,
ලේකම් හා බලතල, කාර්ය, කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
කොළොන්නාව නගර සභාව.

2017 සැප්තැම්බර් මස 07 වැනි දින,
කොළොන්නාව නගර සභාවේ දී ය.

10-25

---

**වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව**

සම්මත අතුරු ව්‍යවස්ථාව පිළිගැනීම

**1952 වසරේ අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත**

1989 වසරේ අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) වන ඡේදය සමග කියවිය යුතු 1952 වසරේ අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පළාත් සභාවේ පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව උතුරු පළාතේ ප්‍රධාන අමාත්‍යතුමා විසින් සාදා 2017.03.24 දින අංක 2011/25 *ගැසට් පත්‍රය* මගින් ප්‍රසිද්ධකර ඇති සම්මත අතුරු ව්‍යවස්ථා 2017.05.02 දිනැති අංක 04 පරිපාලන නියෝගයට අනුව වලිකාමම් උතුරු ප්‍රාදේශිය සභාවේ පිළිගන්නා ලද බව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 123(2) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ආර්. බකීරතන්,
ලේකම්,
වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කන්කසන්තුරෙයි.

10-33

## හලාවත ප්‍රාදේශීය සභාව

### විනෝද බද්ද පැනවීම සම්බන්ධ තීරණය දැනුම් දීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තිය සමග කියවිය යුතු විනෝද බදු ආඥා පනතේ 2 (1) වන උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව හලාවත ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය, කර්තව්‍ය ඉටුකරන හලාවත ප්‍රාදේශීය සභාවේ ලේකම් ආර්.ජේ.ඒ.එස්. හේමලතා වන මම විනෝද බද්ද සම්බන්ධයෙන් ගන්නා ලද 2017.06.07 දිනැති 8008- CXIV අංක දරන තීරණය පහත පරිදි වන බව මෙයින් නිවේදනය කරමි.

තව ද, එකී තීරණයෙහි සඳහන් වූ ප්‍රතිශතයට විනෝද බදු ආඥා පනතේ 2 (2) වැනි උපවගන්තියේ සඳහන් විධි විධාන ප්‍රකාරව ගරු විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව එකී අනුමැතිය සම්බන්ධයෙන් වන නිවේදනයක් *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව බලපැවැත්වෙන බවද තවදුරටත් නිවේදනය කරමි.

ආර්. ජේ. ඒ. එස්. හේමලතා,
ලේකම් / බලතල කාර්ය
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
හලාවත ප්‍රාදේශීය සභාව.

2017 ජුනි මස 07 වැනි දින,
හලාවත ප්‍රාදේශීය සභාවේ දී ය.

#### තීරණය

විනෝද බදු ආඥාපනත යටතට ගැනිය හැකි විනෝද සංදර්ශනයකට ඇතුළ්වීම සඳහා මුදල් අයකරමින් හලාවත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සංදර්ශනය කරනු ලබන විටකදී එසේ ඇතුළු වීමට අයකරනු ලබන මුදලින් 10% ක ප්‍රතිශතයක් වශයෙන් වූ විනෝද බද්දක් පනවා අයකළ යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ 3 වැනි උප වගන්තිය සමග කියවිය යුතු 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ දෙවන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව හලාවත ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය, කර්තව්‍ය ඉටු කරන ලේකම් වන මම තීරණය කරමි.

10-114

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
# සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

*සියළුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | *රු.* | *ශ.* |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | වාර්ෂික දායක මුදල *රු. ශ.* | තැපැල් ගාස්තුව *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 00 | 9,340 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 00 | 950 00 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 00 | 750 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 00 | 2,500 00 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 00 | 450 00 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 00 | 275 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 00 | 4,360 00 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 00 | 3,640 00 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 00 | 1,250 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

## * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල *රු. ශ.* | තැපැල් ගාස්තුව *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවත් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මඟින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2017** | | | |
| **ඔක්තෝබර්** | 2017.10.06 | සිකුරාදා | 2017.09.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.10.13 | සිකුරාදා | 2017.09.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.10.20 | සිකුරාදා | 2017.10.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.10.27 | සිකුරාදා | 2017.10.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| **නොවැම්බර්** | 2017.11.02 | බ්‍රහස්පතින්දා | 2017.10.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.11.10 | සිකුරාදා | 2017.10.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.11.17 | සිකුරාදා | 2017.11.02 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2017.11.24 | සිකුරාදා | 2017.11.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.11.30 | බ්‍රහස්පතින්දා | 2017.11.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| **දෙසැම්බර්** | 2017.12.08 | සිකුරාදා | 2017.11.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.12.15 | සිකුරාදා | 2017.11.30 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2017.12.22 | සිකුරාදා | 2017.12.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.12.29 | සිකුරාදා | 2017.12.15 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2017 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.